www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ආන්ඩුව සහ පොලිසිය අලුත්ගම මුස්ලිම් ජනයාට එරෙහි ප්‍රහාරයේ සාක්ෂි වසන් කිරීමේ තැතක

**රත්නසිරි මලලගම සහ ඩබ්ලිව්.ඒ. සුනිල් විසිනි**
**2014 ජුලි 11**

ජූනි 15 අලුත්ගම සහ බේරුවල ප්‍රදේශයේ මුස්ලිම් ජනයාට එරෙහිව එල්ල වූ ම්ලේච්ඡ ප්‍රහාරයේ සාක්ෂි හිතා මතා ම වසන් කිරීමේ තැතක ආන්ඩුව සහ පොලිසිය යෙදී සිටිති. ප්‍රහාරය උසිගැන්වූයේ ආන්ඩුවේ පිටුබලය ලබන සිංහල බෞද්ධ අන්තවාදී බොදු බල සේනා (බොබසේ) සංවිධානය විසිනි. එය සිදු වූයේ එදින බොබසේ විසින් අලුත්ගම නගරයේ පැවැත්වූ රැස්වීමකින් අනතුරු ව ය. ප්‍රහාරයෙන් මුස්ලිම් පුද්ගලයන් දෙදෙනෙකු හා දෙමල ජාතිකයෙකු මරනයට පත් විය. අසූවකට ආසන්න පිරිසකට තුවාල සිදු විය. ප්‍රහාරකයෝ මුස්ලිම් ජනයාගේ නිවාස හා කඩ සාප්පුවලට පහර දී දැවැන්ත දේපොල විනාසයක් ද සිදු කල හ. ප්‍රහාරකයන් සිත් සේ සිය කටයුත්ත ඉටුකරන තුරු පොලිසිය සහ ආරක්ෂක හමුදාවන් පසෙකට වී බලා සිටියා පමනක් නොව; ප්‍රහාරයට සම්බන්ධ වූ බවට සහ ඊට ගොදුරු වූ නිරායුධ මුස්ලිම් ජනයාට වෙඩි තැබූ බවට ද පොලිසියට හා හමුදාවට චෝදනා එල්ල වී ඇත.

ප්‍රහාරය සම්බන්ධ පරීක්ෂනයේ දී ගින්නෙන් විනාශ වූ දේපොල සම්බන්ධ ව ආන්ඩුවේ රස පරීක්ෂකවරයාගේ වාර්තාවක් ලබා ගැනීම පොලිසිය විසින් මග හැරීම, විනාශ වූ දේපොලවල සුන්බුන් කඩිනමින් ඉවත් කිරීම හා ගොඩනැගිලි ප්‍රතිසංස්කරනය කිරීමට ආන්ඩුව පියවර ගැනීම, ඒ සඳහා ආරක්ෂක හමුදා සාමාජිකයන් යෙදවීම හා ප්‍රහාරයෙන් මිය ගිය 38 වියේ මොහොමඩ් ඉම්රාම් සහ 30 හැවිරිදි මොහොමඩ් සිරාජ් සම්බන්ධව අධිකරන වෛද්‍ය වාර්තාව සාවද්‍ය බවට චෝදනා එල්ල වීම මගින් සිද්ධියට සම්බන්ධ සාක්ෂි යටපත් කිරීමට හා ප්‍රහාරකයන් ආරක්ෂා කිරීමට ආන්ඩුවත්, පොලිසියත් දැනුවත්ව ම ක්‍රියාකරන බව පැහැදිලිය.

රස පරීක්ෂක වාර්තාවක් ලබා ගැනීමෙන් තොරව විනාශ වූ ගොඩනැගිලිවල සුන්බුන් ඉවත් කිරීම හා කඩිමුඩියේ ඒවා ප්‍රතිසංස්කරනය කිරීම සැක සහිත බව ජුලි 3 කලුතර මහේස්ත්‍රාත් අධිකරනයේ පැවති පරීක්ෂනයේ දී වින්දිතයන් වෙනුවෙන් පෙනී සිටි ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපති උපුල් ජයසූරිය සහ ලේකම් අජිත් පතිරන ප්‍රකාශ කලහ. ප්‍රහාරකයන් විසින් "ගිනි තැබූ සමහර ගොඩනැගිලි විනාඩි 5 ක පමන සුලු කාලයක් තුල දැවී අලු වෙලා. එය පෙට්‍රෝල් හෝ ලාම්පුතෙල් යොදා ගැනීමෙන් කල නොහැකි දෙයක්. අතිශයින් ගිනි ගන්නාසුලු වෙනත් දෙයක් ඒ සඳහා යොදා ගන්නට ඇති. ඒ කුමක් දැයි අපට දැන ගැනීමට අවශ්‍ය" බව ජයසූරිය එහිදී සඳහන් කලේ ය. ඒ අනුව රස පරීක්ෂක වාර්තාවක් ඉදිරිපත් කරන තුරු සුන්බුන් ඉවත් කිරීම හා ප්‍රතිසංස්කරන කටයුතු නතර කරන ලෙසත් සතියක් ඇතුලත අදාල ප්‍රදේශය පරීක්ෂා කරන ලෙසත් කලුතර මහේස්ත්‍රාත් අයිෂා ආබ්දීන් රජයේ රස පරීක්ෂකවරයාට නියෝග කලේ ය.

ප්‍රහාරය සම්බන්ධයෙන් ඇසින්දුටු සාක්ෂි තිබෙන නිසා රස පරීක්ෂක වාර්තාවක් ලබා ගැනීම අවශ්‍ය නැතැයි අධිකරන ඇමති රවුෆ් හකීම් පාර්ලිමේන්තුවේදී ජුලි 8 කල ප්‍රකාශය මගින් ආන්ඩුවේ සහ පොලිසියේ ක්‍රියා කලාපය යුක්තිසහගත කිරීමට උත්සාහ කර ඇත.

නීතිඥ සංගමයේ නියෝජිතයන් විසින් ඉම්රාම් සහ සිරාජ් ගේ මරන සම්බන්ධ අධිකරන වෛද්‍ය නිලධාරියාගේ වාර්තාව අභියෝගයට ලක් කරන ලදී. ඇසින් දුටු සාක්ෂි වලට අනුව ඉම්රාම් සහ සිරාස් ගේ මරන සිදු වී ඇත්තේ වෙඩි වැදීමෙනි. ඔවුන්ට වෙඩි වැදුන තැන්වල තිබී හිස් පතොරොම් කොපු 9 ක් ද පොලිසිය විසින් සොයා ගෙන ඇත. වෙඩි තබන අවස්ථාවේ වෙඩික්කරුවන් හඳුනා ගැනීම වැලැක්වීම සඳහා වෙඩි ප්‍රහාරයට ලක්වූවන් දෙසට ෆ්ලෑෂ් ලයිට්

එකක් එල්ල වූ බව ද ඇසින් දුටු සාක්ෂිකරුවන් ප්‍රකාශ කර ඇත. වැලිවේරිය රතුපස්වල ජනයාට එල්ල කල ප්‍රහාරයේ දී හමුදාව විසින් ඒ හා සමාන උපක්‍රමයක් යොදා ගත්තේය. එහිදී විදුලි රැහැන් වලට වෙඩිතබා ප්‍රදේශයේ විදුලි සැපයුම අඩාල කලේ ය.

අධිකරන වෛද්‍ය වාර්තාව ට අනුව මරන සිදු වී ඇත්තේ දරුනු කැපුම් තුවාල හේතු කොට ගෙන ය. මේ අනුව ව්‍යාජ වාර්තා ඉදිරිපත් කිරීමට අධිකරන වෛද්‍යවරයා පොලඹවා ඇති බවට හාත්පසින්ම සැක මතුවේ. ඇසින්දුටු සාක්ෂි සහ අධිකරන වෛද්‍ය වාර්තාව අතර පරස්පර විරෝධය නීතිඥයන් විසින් පෙන්වා දීමෙන් අනතුරුව සිරුරු ගොඩ ගෙන යලි පරීක්ෂා කිරීමට අධිකරනය නියෝග කර ඇත. අලුත්ගම සහ දර්ගා නගරයේ දේපොල කොල්ල කෑම සහ අලාබ හානි කිරීම සම්බන්ධ ව ජූලි 3 වන විට පැමිනිලි 400 ක් ලැබී ඇති බව පොලිසිය උසාවියට වාර්තා කලේ ය.

සාක්ෂි වසන් කිරීමෙන් හා ව්‍යාජ අධිකරන වාර්තා ඉදිරිපත් කිරීමෙන් පෙන්නුම් කෙරෙන්නේ ප්‍රහාරයට ඇති තම සම්බන්ධතාවය යට ගැසීමට ආන්ඩුව මංමුලා සහගත ප්‍රයත්නයක යෙදී සිටින බවයි. මෙවන් තුච්ඡ උපක්‍රම බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයට එරෙහි යුද්ධයේදී මෙන් ම සිය දේශපාලන විරුද්ධවාදීන්, මාධ්‍ය ආයතන, මාධ්‍යවේදීන් සම්බන්ධයෙන් ද ආන්ඩුව, පොලිසිය හා ආරක්ෂක හමුදාවන් අනුගමනය කර ඇත.

මුස්ලිම් විරෝධී වර්ගවාදී ප්‍රහාරය උසිගැන්වීම සම්බන්ධයෙන් මූලිකව වගකිව යුතු බොදු බල සේනා සංවිධානයට එරෙහිව නීතිමය පියවර ගැනීමට ආන්ඩුව සූදානම් නැත. ජුනි 15 අලුත්ගම රැස්වීමේ දී මුස්ලිම් ජනයාට එරෙහිව ප්‍රකෝපකාරී කතා පැවැත් වූ බොබසේ ලේකම් ගලබොඩ ඇත්තේ ඥානසාර ගෙන් හා සිංහල අන්තවාදී ජාතික හෙල උරුමයේ නායකයෙකු වන මධුමාධව අරවින්ද ගෙන් ප්‍රකාශ ලබා ගැනීම සඳහා පොලිසිය සති තුනක් කල්මැරුවේ ය. ඒවා අහම්බෙන් නොව; රාජපක්ෂ ආන්ඩුවේ අනුදැනුම ඇතිව සිදුවෙන දේවල් ය. පසුගිය වසර දෙක තුල මුස්ලිම් හා ක්‍රිස්තියානි පල්ලි හා එකී ජන කන්ඩායම් වලට එරෙහිව ප්‍රහාර 200 ක් පමන බොබසේ, සිංහල රාවය හා රාවනා බලකාය විසින් කල උසිගැන්වීම් මගින් සිදු වී ඇත. ඒ එකක් සම්බන්ධයෙන් වත් වගකිව යුත්තන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමක් සිදු වී නැත. නීති විරෝධී ඝාතන, වධදීම් හා පැහැර ගැනීම් සම්බන්ධයෙන් හමුදාවට හා පොලිසියට රාජපක්ෂ ආන්ඩුව යටතේ ලැබී ඇති දන්ඩ මුක්ත වරප්‍රසාදය ආන්ඩුවේ පිටුබලය සහිත ව ක්‍රියාත්මක වන මෙම ෆැසිස්ට් නැඹුරුවක් සහිත සිංහල - බෞද්ධ අන්තවාදී ව්‍යාපාරවලට ද තිබේ.

ගැඹුරුවන ලෝක ධනවාදයේ අර්බුදයෙන් මැඩී සිටින රාජපක්ෂ ආන්ඩුව වඩ වඩා යොමු වී ගන්නේ කම්කරු පන්තියේ හා පීඩිත මහ ජනතාවන්ගේ ජීවන තත්වයන්ට හා ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට පහර දීමට ය. කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් මැඩලීමේ දී හා වාර්ගික රේඛා ඔස්සේ සිංහල, දෙමල හා මුස්ලිම් කම්කරුවන් බෙදා කම්කරු පන්තිය දුර්වල කිරීම සඳහා බොබසේ ඇතුලු සිංහල -බෞද්ධ අන්තවාදී සංවිධාන පෝෂනය කර ඉස්මත්තට ගැනීම රාජපක්ෂ ආන්ඩුවට අත්‍යවශ්‍යව ඇත්තේ එම තතු තුලය. එහෙයින් අලුත්ගම හා බේරුවල මුස්ලිම් ජනයාට එල්ල වූ ප්‍රහාරය සම්බන්ධයෙන් සාධාරන හා යුක්තිසහගත නීතිමය පියවර ගැනීමක් හා වගකිවයුතු පාර්ශවවලට නිසි දඬුවම් පැමිනවීමක් ගැන බලාපොරොත්තුවීම පලරහිත වනු ඇත.

© www.wsws.org